ආබාධිත රණවිරුවන්ට පිහිටවෙන්න ඔබත් රට දායක වන්න

දයාබර මිතුරනි,

අප රටේ වර්තමාන ත්‍රස්තවාදී ගැටළුව පිළිබඳ ඔබට අමුතුවෙන් කිව යුතු නොවේ. ත්‍රස්තවාදීන්ගේ මිනීමරු ප්‍රහාර හමුවේ දිනපතා අහිංසක රටවැසියන් හා සෙබළුන් මිය යන හා තුවාල ලබන තත්වයක් අද්ගතව ඇත. මෙවන් වාතාවරණයක් යටතේ අප රට වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් සටන් වදින රණවිරුවන් වෙනුවෙන් අප කළ යුතු යුතුකම් බොහෝය.

අපට දැනගන්නට ලැබුණු පරිදි සටනේදී තුවාල ලබා තම ශරීරාංග අහිමිව ආබාධිත වූ රණවිරුවන්ගේ සංඛ්‍යාව 4000 හාර දහසකට වඩා අධිකය. මොවුන්ගෙන් බොහෝ දෙනෙකු දැනට රාගම පිහිටි යුද හමුදා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ රණවිරු සෙවන දීර්ඝකාලීන ප්‍රතිකාර ලබති.

රණවිරුවන්ට කළහැකි උපකාර ගැන සොයාබැලීම සඳහා පසුගිය දිනක යුධහමුදා පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් වෛද්‍ය ශ්‍රියානි වරුසවිතාන මහත්මිය හා අපි සම්බන්ධවුනෙමු. එතුමිය පැවසූ පරිදි දැනට ආබාධිත රණවිරුවන්ගෙන් බොහෝ අය කෘතිම අවයව භාවිතා කරති. එම අවයව පැළඳීමට ප්‍රථම ආවරණයක් (මේස්) පැළඳිය යුතු අතර, එමගින් සමට දැනෙන වේදනාව හා පීඩනය අඩුවී පළඳින තැනැත්තාට දැනෙන අපහසුතාව සමනය වේ. ඇය පැවසූ පරිදි දැනට මේ සඳහා භාවිතා කරනුයේ කපු මිශ්‍ර ආවරණයකි. ඉතා කෙටි අවයව සහිත සෙබළුන්ට මේවා පැළඳීම ඉතා අපහසු හා වේදනාකාරී බවද ඇය පවසයි.

මෙයට ආදේශකයක් වශයෙන් සොකට් ජෙල් ලයිනර් නමැති මේස් වෙළඳපොලේ ඇත. එය ශ්‍රීලංකාවේ නොමැති අතර, මිලෙන්ද ඉතා ඉහළය. තවද ඇය පැවසූ පරිදි 1% ක් පමණ සෙබළුන් සඳහා එනම් 40 ක් පමණ මෙය අවශ්‍යය වේ. සොකට් ජෙල් ලයිනර් එකක් පවුම් **£ 35.18** ක් වන අතර ඒවා 40 ක් සඳහා පවුම් **£ 1407** පමණ අවම වශයෙන් අවශ්‍ය වේ. එහෙත් අපගේ උත්සාහය හැකි උපරිම සංඛ්‍යාවක් මේවා ලබාදීමටය.

මෙම අවශ්‍යතාව සපුරාලීම අප සැමගේ යුතුකමක් වන අතර ඒ සඳහා ඔබගේ සහයෝගය උදක් ම බලා පොරොත්තු වෙමු. ඔබගේ පරිත්‍යාග සහ අනෙකුත් විමසීම් සඳහා පහත නම් සඳහන් අය අමතන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමු.

ධම්මික සිරිපාල 0780 709 5991 dhammika98 @ yahoo.com
නිමේෂ් ජානක 0798 885 1949 nimeshjanaka@ yahoo.com

ශ්‍රීලංකාව මුහුණපාන පාරිසරික ගැටළු

ධන ලෝභී මිනිසා මිහිමවට රිදවයි!

රත්නපුරේ භාරන ලද මැණික් පතලක්

පෘථිවිය, මහා සාගර, කඳු හෙල්, ගල්පර්වත, කාන්තාර, තෙත්බිම්, ඇල දොළ, ගංගා හා මිටියාවත් ආදී විවිධ දේ දක්නට ඇත.

මේ සියල්ල ස්වභාවධර්මයේ අපූර්ව නිර්මාණයෝ වෙති.

මිහිපිට ජීවත්වූ ආදිම මිනිසා මේ සියල්ල ආශ්‍රිතව ජීවත්වූ නමුත් මේවා වෙනස්කිරීමට හෝ විනාශ කිරීමට පෙළඹුණේ නැත. පරිසරයේ අංග ඔහු වෙනස්කළත් ඒ ඉතා සුළු වශයෙනි. ඒ වෙනස්කිරීම් ද මිහිතලයට ඔරොත්තු දියහැකි ඒවා විය.

කෘෂිකර්මාන්තයෙන් යැපුණු ශ්‍රීලංකාවේ අතීතයේ ජීවත්වූ ජනතාව පරිසරයේ තිබුණු තෙත්බිම් වී ගොවිතැන සඳහා යොදාගත්හ. සාමාන්‍ය වියලි බිම් ගෙවත්ත ලෙස යොදා ගෙන එහි ද බෝග වගා කළහ. සෑම ගමක්ම ආශ්‍රිතවම විශාල වනාන්තරයක් විය. එහි කොටසක් දෙයියන්ගේ කැලේ ලෙස හැඳින්වූ අතර එය මිනිසුන්ට තහනම් කලාපයක් විය. මිනිසුන් තම අවශ්‍යතා සපුරාගත්තේ වනාන්තරයේ තවත් කොටසකිනි.

මේ අතරට කුඹුරු යායට ඉහළින් සුදුසු බිමක ඔව්හු වැවක් තනාගත්හ. එසේම වගා කළ නොහැකි ගල්පර්වත හා ගල්තලා ආශ්‍රිත ප්‍රදේශවල ඔව්හු පූජනීය ස්ථාන ගොඩනගාගත්හ.

මේ අනුව භූමියෙහි සෑම කොටසකින්ම උපරිම ප්‍රයෝජන ලබාගනිමින් ඔව්හු පරිසරයට එකඟව ජීවත්වූහ. ලෝකයේ අනෙක් රටවලද ජනතාව මේ ලෙසින් ජීවත්වී ඇති බවට සාක්ෂි ඇත.

එහෙත් කාර්මික විප්ලවයෙන් පසු පොසිල ඉන්ධන සොයාගැනීමත්, වැඩි වැඩියෙන් යන්ත්‍ර සූත්‍ර නිපදවීමත්, භාවිතාකිරීමත් නිසා මේ තත්වය වෙනස් විය. සීඝ්‍රයෙන් ජනගහනය වැඩිවීම නිසා ජනතාවගේ අවශ්‍යතාද බොහෝ සෙයින් වැඩිවිය. ඒ අනුව විවිධාකාර සංවර්ධන ව්‍යාපාර බිහිවිය. මේ නිසා මිනිසා භූමිය වේගයෙන් වෙනස්කිරීමට පටන්ගත්තේය.

උස්බිම් කපා පහත්බිම් බවට පත්කිරීම නිසා වනාන්තර විනාශවීම, ජෛව විවිධත්වයට හානි සිදුවීම, පස සෝදායාම, තෙත්බිම් ගොඩවීම, උල්පත් ක්ෂයවීම, ජලය හිඟවීම වැනි පාරිසරික ගැටළු රැසක් ඇතිවිය.

තෙත්බිම් ගොඩකිරීම නිසා කෘෂි කර්මාන්තය අඩාලවීම, ස්වාභාවිකව ජලය රැඳීමට හානි සිදුවීම, ගංවතුර තර්ජණ ඇතිවීම, වැනි හානි රැසක්ම ඇතිවී තිබේ.

විශාල ජලාශ තැනීමෙන් සංවර්ධනයට මනා දායකත්වයක් ලැබුණද, එයින්ද යම් යම් පාරිසරික ගැටළු හටගෙන ඇත. ගල්පර්වත කැඩීම, වැලි ගොඩලෑම හා මැණික් ගැරීම සඳහා ගංගාවල ඉවුරු හෑරීම වැනි දේ පාංශුඛාදනය හා නායයාම් සඳහා බලපා ඇත.

ගංගා හරවා කාන්තාර සරුබිම්බවට පත්කිරීම, සාගරවල ගල් පර්වත කඩා නැව් ගමනාගමනයට පහසුකම් ඇතිකිරීම හා විශාල උමං මාර්ග හා තෙල් ළිං හෑරීම වැනි ක්‍රියා විවිධ රටවල සිදුකෙරේ. ඉන් විශාල මට්ට-මෙන් ආර්ථික වාසි ඇතිවන නමුත් ඒවාට සමගාමීව විවිධ පාරිසරික ගැටළුද පැන නගින බව අප විසින් අමතක නොකළ යුතු ය.

විශ්‍රාමලත් විදුහල්පති
♦ එස්. ජයසුන්දර
උඩුගම Sri Lanka

How the IMF ruined Sri Lanka and alternative programmes of success

By -Dr Garvin Karunaratne

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රීලංකාව විනාශකළ හැටි සහ රට සාර්ථක විකල්ප ක්‍රියාපිළිවෙත්

කර්තෘ - ආචාර්ය ගාවින් කරුණාරත්න

පසුගිය දිනවල ප්‍රවෘත්ති මාධ්‍ය මගින් තරමක ආන්දෝලනයක් ඇතිකරනු ලැබූ ලෝක වෙළඳ සංවිධානයේ (World Trade Organisation - WTO) සාකච්ඡා බිඳවැටීම ඉදිරි අනාගතයේ ලොව හැම රටකටම ආර්ථික වශයෙන් බලපාන වැදගත් කරුණක් විය. ඒ විශේෂයෙන්ම රටවල් අතරේ වෙළඳ ගණුදෙනු වලදී මිළ, ද්‍රව්‍ය ප්‍රමාණ, තීරු බදු ආදිය පිළිබඳ සම්මුතිවලට මේවායේ දී එකඟත්වයකට එළඹීම සහ, ඒ අනුව හැම රටක්ම ගනුදෙනු කිරීම ඇරඹෙන නිසා ය.

මෙයින් වඩාත්ම අහිතකර බලපෑම ඇතිවන්නේ වැඩිම සංඛ්‍යාව වන අප ලංකාව වැනි රටවලට ය.

අපේ බොහෝ අය මේ ප්‍රවෘත්තිය ගැන වැඩිතැකීමක් නොකරති. ඒ, බොහෝ විට මේ වෙළඳ ගණුදෙනු හා සම්මුති සමග අප රටවල් බැඳී ඇති ආකාරය ගැන අවබෝධයක් නොමැතිවීම නිසා ය. නමුත් මේවායේ අහිතකර බලපෑම් අප සැවොම ද, ලංකාව වැනි රටවල දුප්පත් ජනතාව බහුතරයක් ද විඳිනු නොඅනුමාන ය. මෙවැනි අවස්ථාවක දී මේ පිළිබඳව අවබෝධයක් ලබාගැන්මට උපකාරී වන ඉහත සඳහන් වැදගත් පොත ලංකාවිත්ති පාඨකයන්ට මෙසේ හඳුන්වා දෙන්නට ලැබීම සතුටකි.

අන්තර් ජාතික මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව යන ආර්ථික ආයතන **(IMF & World Bank)**

1944 දී දෙවන ලෝක සංග්‍රාමය අවසන් වෙන් පැවති අතර ඇමරිකාව, බ්‍රිතාන්‍යය ප්‍රමුඛ සම්මුති රටවල් ජයගන්නා ලකුණුද පහළවෙන් පැවතිණ. එවකට බලගතු එම කණ්ඩායමේ රටවල් 44 ක් එකතු වී ඇමරිකාවේ නව හැම්ප්ෂයර් හි බ්‍රෙටන් වුඩ්ස් **Bretton Woods** නමැති ග්‍රාමයේ පැවැත්වූ සම්මේලනයකදී යුද්ධයෙන් පසු බිහිවන ලෝකයේ, යුද්ධයට පෙර පැවති ආර්ථික අවුල් වියවුල් තුරන්කොට ස්ථාවර තත්වයක් ඇතිකරලීමේ යෝජනා සම්මත විය. ඒවා ක්‍රියාත්මක කිරීමට රටවලට ණයදීම සඳහා අන්තර් ජාතික මූල්‍ය අරමුදලක්ද, ඒ මුදල් ක්‍රමවත්ව හැසිරවීම සඳහා සංවර්ධන ආයතනයක්ද (මෙය ලෝක බැංකුව ලෙස පසුව නම් කෙරිණ.) පිහිටුවන ලදී. මෙම ආයතන ඒ මුල් අවධියේ සිට 1970 අග භාගය දක්වා වාගේම නව නිදහස් රටවල් ඇතුළු ලොව සියළු රටවල සංවර්ධනයට අවංකවම ආධාර කළ ආකාරය සිය පොතට හැඳින්වීමක් කරන ආචාර්ය ගාවින් කරුණාරත්න ලංකාවේ පරිපාලකයෙකු වශයෙන් ලද සිය අත්දැකීම් තුළින්ම පෙන්වා දෙයි.

1948 අප රටට නිදහස ලැබීමෙන් පසු රාජ්‍ය හා පෞද්ගලික අංශවල මිශ්‍ර ආර්ථිකයන් යටතේ දශක දෙකකටත් වැඩි කාලයක් තුළ කිසිම විදේශීය ණයවීමකින් තොරව රජයේ භාණ්ඩාගාරයේ මුදල් වලින්ම ගල්ඔය වැනි මහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අකාරය ඔහු එහි දී පැහැදිලි කරයි.

මූල්‍ය අරමුදල **IMF** සහ ලෝක බැංකුව **(World Bank)** 1970 දශකයේ අගභාගය වන විට යටත්විජිතවාදී බලවත් රටවලද විශේෂයෙන් ඇමරිකා එක්සත් ජනපදයේද බලපෑම් වලට යටවීම නිසා ඔවුන්ගේ නව යටත්විජිතවාදී අරමුණු ඉටුකරනු වස් වෙනත් ආකාරයට කටයුතු කිරීම ඇරඹූහ. ඔවුන්ගේ ආර්ථික ආයුධ බවට පත්වූහ. 1970 දශකය තුළදී ලෝක තෙල් මිළ වැඩිවීමේ ප්‍රශ්නය නිසා ආර්ථික අර්බුදවලට මුහුණ දීමට සිදුවූ බොහෝ සංවර්ධනය වන රටවලට ලෝක බැංකුව විසින් ඉල්ලූ පරිදි ණය දෙන ලද අතර එසේ ණයවුණු එම රටවලට එම ආයතන දෙකින් පණවන ලද කොන්දේසි අනුව කටයුතු කරන්නට බලකෙරිණ.

1977 දී අප රටේ බලයට පත් ජේ. ආර්. ජයවර්ධන රජය අප ආර්ථිකය සඳහාද එම ආයතනවල නිර්දේශ අනුව යමින් විවෘත ආර්ථික සංකල්පය පිළිගත් අතර එතැන් සිට එයට පසු බලයට පත් රජයයන් ද ඒ මගම ගත් නිසා අද දක්වාම අපේ රටේ ඇතිවී තිබෙන ආර්ථික පරිහාණිය ආරම්භයේ දී ම මෙම පොතෙන් පැහැදිලි කරයි.

ව්‍යුහගත සැකැසුම් වැඩපිළිවෙල **Structural Adjustment Programme**

මෙසේ ණයගැතිවී සිටින රටක ආර්ථිකය තමන්ට රිසි පරිදි මෙහෙය වන්නට මූල්‍ය අරමුදල ලෝක බැංකුව භාවිතාකරන උපක්‍රම නම් ඒ රටේ ආර්ථික ව්‍යුහයේ සැකසුම් වැඩපිළිවෙලක් ක්‍රියාවට නැගීමය. මෙහිදී එයට යටත් වන රටට මූලික වශයෙන්ම තමන්ට අවශ්‍ය අන්දමට තම ආර්ථිකය හැසිරවීමට තිබෙන අයිතිය නැතිව යයි. මේ ක්‍රමය මගින් ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් ආර්ථික ආධිපත්‍යය ලොව හැමතැනම පවත්වාගැනීම සහ පැතිරවීම මෙම පොතේ සවිස්තරව දක්වා ඇත.

1977 අය වැයේදී ඇමරිකානු ඩොලර් මිලියන 170 ක් වූ ලංකාවේ විදේශ විනිමය අය ශේෂය ක්ෂයවී වසර පහක් ගතවීමට ද පෙර ඩොලර් මිලියන 892 ක විදේශ විනිමය ණයක් බවට හැරීම සහ 1995 වන විට ඩොලර් මිලියන 997 දක්වා ද එම ණය ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පැවතීම.

ආර්ථිකයේ ලිහිල් කරණය සහ විවෘත ආර්ථිකයක් බවට හැරවීම **Liberalization of the Economy - Open Economy)** 1977 අප ආර්ථිකය තුළ කෙරුණ, කාටත් දැනුණ, පෙනුණ ප්‍රධානතම දෙය මෙයයි. රටට ලැබෙන විදේශ විනිමය මධ්‍යම බැංකුව මගින්, විනිමය සම්පත් ප්‍රවේශමෙන් රටේ සංවර්ධන අවශ්‍යතාවන්ට අනුව වියදම් කිරීමේ එතෙක් පැවති පිළිවෙත සම්පූර්ණයෙන්ම බිඳහෙළමින්, ඉවක් බවක් නැතිව ආනයනය සඳහා විනිමය සම්පත් වෙන්කිරීම ඇරඹිණ.

මෙය ප්‍රයෝජනයට ගනිමින් ව්‍යාපාරිකයෝ වටිනා නොවටිනා නානාප්‍රකාරදේ ආනයනය කළහ. ඒ අවස්ථාවේ **World Market** යන ලෙස පටබැඳුණු කොළඹ කොටුවේ වැතැම් වීදියේ බිහිවුණ වෙළඳපොළම මෙයට නිදසුනකි. හොංකොං, ජපන්, සිංගප්පූරු ආදී රටවලින් ආ වෛවාරණ නොවටිනා ප්ලාස්ටික් බඩුවලින් පිරුණ ආකාරය කාටත් මතක ඇත. මුළු රටට ද සිදුවූයේ මෙයයි. මීට උවමනා විදේශ විනිමය ලෝක බැංකුවෙන් ලද විදේශ ණය වලින් සැපයිණ. පරම්පරා ගණනකට අප රටේ අනාගතය උගස්කරමින් " ***හෙට මැරුණත් හිතට සැපයි අද පොලිකරලා*** " සංස්කෘතිය ආරම්භ විය.

විවෘත ආර්ථිකයේ අනිවාර්ය ප්‍රතිඵලයක් වූයේ රටේ අයවැය සකස් කරන්නට ගිය විට රජයට මුහුණදීමට සිදුවූ විදේශ ණය ඇතුළු අයවැය පරතරයයි. මෙය රටකට නුසුදුසු ලක්ෂණයක් ලෙස මූල්‍ය ආයතනවල පිළිගැනීම වූ අතර එයට පිළියම් වශයෙන් යෝජනා කෙරුණේ රාජ්‍ය අංශයේ දේපොළ සහ අය මාර්ග පෞද්ගලික අංශවලට (දේශීය සහ අන්තිමේදී විදේශීය පෞද්ගලික ආයතන වලට) විකුණා දැමීමට ය.

ලෝක බැංකුවේ ප්‍රධාන පාඨය වූයේ රාජ්‍ය අංශය ආර්ථික වශයෙන් අකාර්යක්ෂමය, දුර්වලය. පෞද්ගලික අංශය කාර්යක්ෂමය, ශක්තිමත්ය යන්නයි. මේ අනුව අප රටේ එතෙක් විවිධ අංශවල ගොඩනැගී තිබුණු (ස්වයංපෝෂිතව පවා තිබුණු) ධන සම්පත් හා නිශ්පාදන අංශ ශ්‍රීඝ්‍රයෙන් බිඳවැටීම සිදුවන්නට විය. එහි ප්‍රතිඵලය වූයේ අපේ නිශ්පාදන ශක්තිය බිඳවැටීම සමගම අපේ රුපියලේ වටිනා කමද අනෙක් අන්තර්ජාතික මුදල් ඒකක වලට අනුපාතිකව දිගින් දිගටම පහතවැටීමය. මෙසේ අප ආර්ථිකය බිඳවැටුණු ආකාරය හා එහි සීඝ්‍ර පරිහානිය පොතේ මනාව පැහැදිලි කර ඇත. අප රට සේම ලෝකයේ වෙනත් සංවර්ධනය වන රටවල්වලටද ලෝක බැංකුව ප්‍රමුඛ මේ ආයතනයන්හි සූත්‍ර පිළිපැදීම නිසා ආර්ථික පරිහානියට මුහුණදෙන්නට සිදුවූ ආකාරය ද විස්තරකර තිබේ. එසේම මෙම ආයතන වලින් යෝජනා කරන මෙම සූත්‍ර ප්‍රතික්ෂෙප කරමින් සිය ආර්ථිකය හසුරුවාගත් ඉන්දියාව, මැලේසියාව ආදී රටවල් අද ඉදිරියට ගමන්කරන ආකාරය ද පෙන්වාදෙයි.

පරිහානියෙන් ගොඩ ඒමේ මාර්ග

මේ පරිහානිය පිළිබඳ විමසුමක් හා හේතු පැහැදිලිකිරීමෙන් පමණක් නො-නැවතී ප්‍රායෝගික ලෙස එයින් ගොඩඒම පිළිබඳව පාඨක අවධානය යොමුකරන කතුවරයා 22, 23 පරිච්ඡේද මගින් ඔහුගේ උපදේශකත්වය යටතේ බංගලා දේශ් රජයේ තරුණ සංවර්ධන අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශයේ ද මූලික සහභාගිත්වයෙන් එය සාර්ථකව ක්‍රියාත්මක කළ අකාරය ද පැහැදිලි කරයි. ගොඩඒමට ඇති එකම මග නම් අප රටේ තරුණ පරම්පරාවද සහභාගි කරගෙන මේ පාරිභෝගික ආර්ථිකයෙන් ඉවත්වී නිශ්පාදන ආර්ථිකයක් ශ්‍රීලංකාව තුළ ක්‍රියාත්මක කිරීමෙන් පමණක් බව ඔහු පෙන්වාදෙයි.

මෙය **හාන්සි පුටු විමර්ෂකයෙකු** ලෙස නොව කාලයක් තිස්සේ අප රටේම පරිපාලකයෙකු සේම ආර්ථික විද්‍යා අංශවල පර්යේෂකයෙකු ලෙස ඒ මහතා අදාල ක්ෂෙත්‍රයන්ට ගොස් ඒ රටවල පවා සාර්ථකව ක්‍රියාත්මක කළ ඒ වැඩ සටහන් අප යායුතු මගද පෙන්වන බව ද අවධාරණය කරයි.

අද අපේ රට මුහුණ පා ඇති තත්ව යෙන් ගොඩ ඒමට උනන්දුවක් දක්වන සෑම දේශ හිතෛෂියෙකු විසින් ම අනිවාර්යයෙන්ම කියවියයුතු වටිනා, පොතකි මේ. සරල පැහැදිලි පරිවේෂද ආර්ථික විද්‍යා විශේෂඥයාට මෙන්ම විමර්ශනශීලී සාමාන්‍ය පාඨකයාට ද පහසුවෙන් තේරුම්ගත හැකිසේ මෙහි ඉදිරිපත්කර ඇත.

මෙය ලියන මම ද ආර්ථික විශේෂඥයෙකු නොවෙමි. විශේෂත්වයෙන් භෞතික විද්‍යාඥයෙක්මි. නමුත් මම මෙය ආශාවෙන් කියැවීමි. අප රට ගැන මහා දැනුමක් හා ප්‍රායෝගික අත්දැකීම් ඇති ආචාර්ය ගාවින් කරුණාරත්නයන් වැනි විද්වතුන්ගෙන් රටේ ඉදිරිගමන සඳහා අද දවසේ රට කරවන්නවුන් නිසි ප්‍රයෝජනගැන්ම ඉතා වැදගත් බව අවසන් වශයෙන් කියනු කැමැත්තෙමි.

♦ වකුල ගුණපාල
Ilford, Essex UK